Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය 08 ශ්‍රේණිය 2023**
**Second Term Test - Grade 08 - 2023**

# භූගෝල විද්‍යාව

කාලය: පැය 2 යි

නම / විභාග අංකය:

## I කොටස

- I කොටසේ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම සපයන්න.
- ප්‍රශ්න අංක 1 සිට 5 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ආලෝකය සහ තාපය නිකුත්කරන ග්‍රහ වස්තූන් .................................. ලෙස හැඳින් වේ.
(තාරකා / ග්‍රහලෝක / ධූමකේතු)

02. සූර්යයාගේ භ්‍රමණ කාලය පෘථිවියේ දින ..................... ක් වේ.
(24.4 / 25.4 / 23.4)

03. මතුපිට ගිණිකඳු පිපිරීමෙන් නිර්මාණය වූ ආවාට දැකගත හැකි වන්නේ .......................... ග්‍රහලෝකයේ ය.
(සිකුරු / සෙනසුරු / බුධ)

04. අඟහරු ග්‍රහලෝකය තුනී වායු ගෝලයකින් යුතුවන අතර ප්‍රධාන වායුව ....................... වේ.
(නයිට්‍රජන් / කාබන්ඩයොක්සයිඩ් / ඔක්සිජන්)

05. මුහුදු මට්ටමේ පිහිටි සුන්දරබාන් වගුරුබිම පිහිටා ඇත්තේ ............................... ය.
(බංග්ලාදේශයේ / ඉන්දියාවේ/ නේපාලයේ)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ කියවා බලා නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. පෘථිවි තලයෙන් 29% ක් පමණ ගොඩබිම් ප්‍රදේශ වේ. ( )
07. ඉන්දියාව හා බංග්ලාදේශය අතර ථාර් කාන්තාරය පිහිටා ඇත. ( )
08. පෘථිවි භ්‍රමණය සිදුවන්නේ නැගෙනහිර සිට බටහිර දෙසටය. ( )
09. යුරේනස් ග්‍රහලෝකය වටා ඉතා දර්ශණීය වළලු පද්ධතියක් පිහිටා ඇත. ( )
10. වාමන ග්‍රහයින්ට අයත් උප ග්‍රහයින් ගණන 08 කි. ( )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

11. දේශාංශ $0^0$ රේඛාව .................................................................. රේඛාව ලෙස ද හඳුන්වයි.
12. දකුණු ආසියාතික සහයෝගිතා සංවිධානයට අයත් ඇෆ්ගනිස්ථානය භූගෝලීය වශයෙන් අයත් වන්නේ .......................................... ය.
13. දකුණු ආසියාතික කලාපය තුළ ............................................................ දේශගුණය පවතියි.
14. ශ්‍රී ලංකාව අයත් වන්නේ ........................................................ වේලා කලාපයට ය.
15. යම්කිසි ප්‍රදේශයක භෞතික පරිසරය හා ඒ මත ගොඩනැගුණු මිනිස් ක්‍රියාකාරකම් හි සමස්තය ........................................ ලෙස හැඳින් වේ.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවල දී ඇති පිළිතුර අතරින් නිවැරදි හෝ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

16. 2006 වර්ෂයේ දී අන්තර් ජාතික තාරකා විද්‍යා සංගමය විසින් වාමන ග්‍රහයෙකු ලෙස නම් කරන ලද්දේ,

 i. ප්ලූටෝ ය. ii. යුරේනස් ය. iii. නෙප්චූන් ය. iv. සෙරීස් ය.

17. සෞරග්‍රහ මණ්ඩලයේ නැගෙනහිර සිට බටහිර දෙසට භ්‍රමනය වන ග්‍රහලෝකය කුමක් ද?

 i. බුධ ii. සිකුරු iii. පෘථිවි iv. සෙනසුරු

18. පෘථිවි ග්‍රහයා පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

 i. පෘථිවිය මත අක්ෂාංශ හා දේශාංශ රේඛා ජාලයක් පවතී.
 ii. සූර්යයාට ඉතා ආසන්නයේ පිහිටා ඇත.
 iii. සෞරග්‍රහ මණ්ඩලයේ තුන්වන විශාලතම ග්‍රහලෝකය වේ.
 iv. වර්ග කිලෝමීටර් මිලියන 510 ක් පමණ වූ ගෝලාකාර වස්තුවකි.

19. පාකිස්ථානයේ පිහිටි කඳු වැටියකි.

 i. හිමාලය වැටිය. ii. සුලෙයිමාන් වැටිය. iii. සාටිස් වැටිය. iv. කරකෝරම් වැටිය.

20. දකුණු ආසියානු කලාපය පිළිබඳ වැරදි ප්‍රකාශය තෝරන්න.

 i. දකුණු ආසියානු කලාපය උතුරින් හිමාලය කඳු වැටියෙන් සීමා වේ.
 ii. දේශගුණය හා වෘක්ෂලතාවල විවිධත්වයක් ඇත.
 iii. සමකයේ සිට දළ වශයෙන් උතුරු අක්ෂාංශ $36^0$ දක්වා විහිදේ.
 iv. සමස්ත පෘථිවි තලයෙන් 3% ක භූමි ප්‍රදේශයක් මීට අයත් වේ.




---

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.**

01. (අ) පහත A, B, C, D යන අක්ෂරවලින් දක්වෙන අභ්‍යාවකාශ වස්තූන් හැඳිනගෙන නම් කරන්න.(ලකුණු 4)

A

B

C

D



(ආ) පෘථිවිය පිළිබඳ මූලික තොරතුරු කිහිපයක් පහත දක් වේ. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (ලකුණු 4)

(12,714km, තත්පරයට කිලෝමීටර් 29.8, දින 365 පැය 6, පැය 23 විනාඩි 56, කිලෝමීටර් මිලියන 150, පැය 24 වි. 6 , 12756km)

1. සූර්යයාගේ සිට පෘථිවියට ඇති දුර ....................................
2. පෘථිවි පරිභ්‍රමණ වේගය ....................................
3. ධ්‍රැවක විශ්කම්භය ..............................................
4. පෘථිවියේ භ්‍රමණ කාලය ..................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(ඉ) දකුණු ආසියානු කලාපය දැක්වෙන සිතියම ඇසුරින් දී ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන මුහුද නම් කරන්න. (ලකුණු 1)

(ii) B අක්ෂරයෙන් දැක්වෙන ගංගාව නම් කරන්න. (ලකුණු 1)

(iii) C අක්ෂරයෙන් දැක්වෙන රට නම් කරන්න. (ලකුණු 1)

(iv) D අක්ෂරයෙන් දැක්වෙන රටෙහි අගනුවර නම් කරන්න. (ලකුණු 1)

(v) E අක්ෂරයෙන් දැක්වෙන බොක්ක නම් කරන්න. (ලකුණු 1)

(vi) පාකිස්ථානය දැක්වෙන්නේ කුමන අක්ෂරයෙන් ද? (ලකුණු 1)

(vii) ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පිහිටි සමුද්‍ර සන්ධිය ලියන්න. (ලකුණු 2)

02. (i) පහත වගුවේ හිස්තැන්වලට සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න. (ලකුණු 8)

(9.9, 1407.6, 62, 67, 17.2, 88, සෙනසුරු, සිකුරු, 30589, 224.7)

| ග්‍රහලෝකය | භ්‍රමණ කාලය (පැය) | පරිභ්‍රමණ කාලය | උප ග්‍රහයින් ගණන |
|---|---|---|---|
| බුධ | i. .................... | ii. .................... | 0 |
| බ්‍රහස්පති | iii. .................... | 4331 | iv. .................... |
| v .................... | 15.7 | 10747 | vi. .................... |
| යුරේනස් | vii. .................... | viii. .................... | 27 |


(ii) විශ්වය නිරීක්ෂණය සඳහා මුල්වරට දුර දක්නය නිපදවූයේ කවුරුන් විසින් කුමන වර්ෂයේ දී ද? (ලකුණු 2)

(iii) විශ්වය නිරීක්ෂණය සඳහා ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටුවා ඇති ආයතනය කුමක් ද? (ලකුණු 1)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com


03. (i) වාමන ග්‍රහලෝක යනු මොනවා ද? (ලකුණු 3)

(ii) රූප සටහනේ A, B, C, D අක්ෂරවලින් දක්වෙන වාමන ග්‍රහලෝක හැඳිනගෙන නම් කරන්න. (ලකුණු 4)




(iii) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳව තොරතුරු හෙළිකරගත් විද්‍යාඥයින් හතර දෙනෙකු නම් කරන්න. (ලකුණු 4)

04. (i) පහත දී ඇති රූප සටහනේ හිස්තැන්වලට අදාළ පිළිතුරු A, B, C, අනුපිළිවෙලින් ලියන්න. (ලකුණු 3)





(ii) පෘථිවියේ ප්‍රධාන ඍතුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ ඇසුරින් පහත වගුව පුරවන්න. (ලකුණු 8)

| ඍතුව | ප්‍රධාන ලක්ෂණ | |
|---|---|---|
| I. .................................. | II. .................................. | ශාකපත්‍ර හැකිලී යයි. |
| සිසිර | III .................................. | IV. .................................. |
| V. .................................. | හිම හා අයිස් දියවී යයි | VI. .................................. |
| ගිම්හාන | VII.................................. | VIII. .................................. |

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

05. (i) පහත ආදර්ශ ගෝලයේ A, B, C, අක්ෂරවලින් දැක්වෙන අක්ෂාංශ රේඛා නම් කරන්න. (ලකුණු 3)




(ii) (a) පෘථිවි භ්‍රමණයේ ප්‍රතිඵල 2ක් ලියන්න.

(b) සම්මත වේලා කලාප කිහිපයක් ඇති රටවල් තුනක් ලියන්න. (ලකුණු 5)

(iii) පෘථිවිය ජීවීන්ගේ පැවැත්මට හිතකර ග්‍රහලෝකයක් වීමට බලපා ඇති සාධක 3ක් ලියන්න. (ලකුණු 3)

06. (i) පෘථිවියේ ජලය පවතින ආකාර 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) (a) ජලගෝලය මිනිසාට වැදගත්වන ආකාර 2ක් ලියන්න.

(b) මිනිස් ක්‍රියාකාරකම් නිසා ජලය දූෂණය වන අවස්ථා තුනක් ලියන්න. (ලකුණු 5)


(iii) (a) පෘථිවි වායුගෝලයේ වැඩිම සංයුතියක් සහිත වායුව කුමක් ද?

(b) වායුගෝලයේ ඇති ප්‍රයෝජන 3ක් ලියන්න. (ලකුණු 4)

07. (i) දකුණු ආසියාවට අයත් දූපත් රාජ්‍ය දෙකක් ලියන්න. (ලකුණු 2)

(ii) පහත A, B, C වලින් දැක්වෙන දකුණු ආසියාතු කලාපයේ දැකගතහැකි භූ දර්ශන නම් කරන්න. (ලකුණු 3)

A



B



C



(iii) (a) හිමාලය කඳුකරය ආශ්‍රිත ජීවත්වන ගෝත්‍රික ජන වර්ග 4ක් ලියන්න.

(b) කඳුකර භූ දර්ශනය ආශ්‍රිත ජනයාගේ හඳුනාගත හැකි විශේෂිත ශාරීරික හැඩ ගැසීම් 2ක් ලියන්න.

(ලකුණු 6)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

08. පහත සපයා ඇති උපකාරක පද ඇසුරින් ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

**පහළට**

1 වල්ගාතරු

2 සෞරග්‍රහ මණ්ඩලයේ ප්‍රධානියා

3 දකුණු ආසියාවේ විශාලතම රට

4 බ්‍රහස්පති ග්‍රහලෝකය සතු බලය

6 සෞරග්‍රහ මණ්ඩලයේ විශාල ගෝලාකාර වස්තූන්

10 ප්‍රධාන ඍතුවකි.

**හරහට**

5 අඟහරු ග්‍රහයාට තවත් නමකි.

7 ආසියා මහාද්වීපයේ විශාලම රට

8 උතුරු අක්ෂාංශ 23 1/2 හඳුන්වන නම

9 සෙල්සියස් අංශකවලින් මනිනු ලැබේ.

11 ඉස්ලාම් භක්තිකයන් පදනම් කරගත් උත්සවයකි.

